#mediaethicsSL #SinhalaPress #lka #SundayLankadeepa #February24

පුවත්පතක පළවන ලිපියක් තුළින් යම් අදහසක් සමාජගත කිරීම මූලිකව ගැටළුවක් නැත. කෙසේ වෙතත්, පුවත්පත් ලිපියක් ඔස්සේ සමාජගත කෙරෙනා අදහස එක් දෘෂ්ටි කෝණයකින් පමණක් බලමින්, ඒ පිළිබඳව ඇති අනෙකුත් පැතිකඩ නොසලකා හරිමින් ඉදිරිපත් වන්නේ නම්, එය ගැටළුවක් නොවන්නේද?

මේ සඳහා උදාහරණයක් ලෙසින් ඉරිදා ලංකාදීප පුවත්පතේ "අසංවර ඇඳුම් විලාසිතා කාන්තා හිංසනයට හේතුවක්ද" යන මැයින් පළවී ඇති ලිපිය පෙන්වා දිය හැක. මෙම ලිපිය තුළ දිගින් දිගටම පෙන්වා දෙන්නට උත්සාහ කරන්නේ පොදු ස්ථානයන්හි කාන්තාවන් ලිංගික හිංසනයට ලක්වීමට හේතුව වන්නේ කාන්තාවන්ගේ ඇඳුම් විලාසිතාවන් වන බවයි. එසේම කාන්තාවන්ගේ එවැනි විලාසිතාවන්, ලිංගික හිංසනයන් සිදුකිරීම සඳහා අසහනකාරී පුද්ගලයින්ට උත්තේජනයක් වන බවද මාධ්‍යවේදියා සඳහන් කරයි. වැඩිදුරටත් උක්ත අදහස්ම සනාථ කරනා අදහස් කිහිපයක් විශ්ව විද්‍යාල ආචාර්යවරියකගෙන් හා මෝස්තර නිර්මාණ ශිල්පියෙකුගෙන්ද, ලිංගික හිංසන හා ළමා අපයෝජන පිළිබඳ සංඛ්‍යාත්මක දත්ත පොලිස් මාධ්‍ය ප්‍රකාශක වරයාගෙන්ද ලබාගෙන උපුටා දක්වා ඇත.

මෙහිදී අපට කරුණු කිහිපයක් ප්‍රශ්න කිරීමට හැක. පළමුකොටම, කාන්තාවන්ට මුහුණ දීමට සිදුවන ලිංගික හිංසනයන්ට මූලිකම හේතුව කාන්තාවන්ගේම විලාසිතාවන් යැයි පැවසීම, ස්ත්‍රී පුරුෂ භාවය සලකමින් කාන්තාවට වෙනස් කොට සැලකීමක් නොවන්නේද? එපමණක් නොව, කාන්තාවට සිදුවන ලිංගික හිංසනයන් සම්බන්ධයෙන් හිංසකයාට ඇති වගකීමද මෙම ලිපිය ඔස්සේ සැලකිය යුතු අන්දමින් ලිහිල් කොට දක්වා නොතිබෙන්නේද? ඒ වෙනුවට වින්දිතයා වෙත අපරාධයේ වගකීම පැටවීමක් සිදුවී නැතිද? දෙවෙනුව, මෙම ලිපිය මගින් ජනගත කරන්නට උත්සාහ කරනා මතය ශක්තිමත් කරනා අදහස් පමණක් මූලාශ්‍රයන්ගෙන් ලබාගැනීම ඔස්සේ එම ලිපියේ සමබරතාවය ගිලිහී ගොස් නැතිද?

පුවත්පතක සමාජ ගැටළුවක් සම්බන්ධයෙන් පළ කෙරෙනා ගවේෂණාත්මක ලිපියක් මගින් සිදුකළ යුත්තේ එම සමාජ ගැටළුව සමබරව ආමන්ත්‍රණය කිරීමයි. එසේ නොවී එම පුවත්පත් ලිපියද ගැටළුවේම කොටසක් බවට පත්වීම නොසළකා හැරිය හැකි නොවේ. මේ සම්බන්ධයෙන් පාඨක ඔබේ අදහස කුමක්ද?

ඉරිදා ලංකාදීප සම්පූර්ණ ලිපිය සඳහා
සබැඳිය: http://www.lankadeepa.lk/sunday/thaksalawa/%E0%B6%85%E0%B7%83%E0%B6%82%E0%B7%80%E0%B6%BB--%E0%B6%87%E0%B6%B3%E0%B7%94%E0%B6%B8%E0%B7%8A-%E0%B7%80%E0%B7%92%E0%B6%BD%E0%B7%8F%E0%B7%83%E0%B7%92%E0%B6%AD%E0%B7%8F-%E0%B6%9A%E0%B7%8F%E0%B6%B1%E0%B7%8A%E0%B6%AD%E0%B7%8F-%E0%B7%84%E0%B7%92%E0%B6%82%E0%B7%83%E0%B6%B1%E0%B6%BA%E0%B6%A7--%E0%B7%84%E0%B7%9A%E0%B6%AD%E0%B7%94%E0%B7%80%E0%B6%9A%E0%B7%8A%E0%B6%AF--/55-546200